

# කන්න තුනේ ගොවිතැනට බට ගොවි මහතෙක්

වසරක් තුළ කන්න දෙකක් වගා කිරීමේ ගතානුගතික ක්‍රමය වෙනුවට, කන්න තුනක් වගා කළ හැකි වූවොත් අපේ වී නිෂ්පාදනය සෑහෙන ප්‍රමාණයකින් නැංවීමට එය උපකාරී වනු ඇත. මෙය සෑහෙන කලක් මුළුල්ලේ විද්‍යාඥයින්ගේ සැළකිල්ලට යොමු වූ කරුණකි.

කන්න තුනක් ගොවිතැන් කිරීමට සිය කැමැත්තෙන් ඉදිරිපත් වූ ගොවි මහතෙක් ළඟදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේදී අපට හමුවිය.

මීට ඇවුරුද්දකට පමණ පෙර තම උපන් ගම වූ කෑගල්ලේ සිට පොළොන්නරුවට පැමිණි හිඟුරක්ගොඩ-හතමුන, සිරිල් ජයකොඩි මහතා ගොවිතැන තම ජීවන වෘත්තිය කර ගත්තේය. ඉඩමක් බදුගෙන ගොවිතැන් කරන අතර, හිඟුරක්ගොඩ සංසදාස මහතාට අයත් අක්කර 3 ක ඉඩමක් ගොවිතැන් කිරීමට ඔහු භාර ගත්තේය.

මෙතෙක් කල් වගා කළ පැරණි ක්‍රමය වෙනුවට 1973/74 මහ කන්නයේදී අළුත් ක්‍රමයකට මෙම කුඹුර වගා කිරීමට ඔහු ඉටා ගත්තේය. ඒ අනුව කුඹුරු හිමියා සමග සාකච්ඡා කළ ඔහු වසරකට කන්න තුනක් වගා කිරීම ඇරඹීය. අක්කර 2 ක වී වගාවද, අක්කරයක ගොඩ බෝගද ඇරඹූ ඔහු ට්‍රැක්ටරයක් යොදා කුඹුර සකස් කළේය. දෙපාර්තමේන්තුවෙන් ලබාගත් බීජී 34-8 වී වර්ගයේ තවාන් දමන ලද්දේ නියරවල් වලය. ජනවාරි මුල් භාගයේ තවාන් දැමූ ඔහු පෙබරවාරි මුල් හරියේදී පැල උදුරා සිටුවීය. අක්කරයක පැල උදුරා සිටවූ අතර ඉතිරි කොටසේ වී ඉස්සේය. නිර්දේශිත රසායනික පෝර භාවිතය කළේය. වගාවට අවශ්‍ය සියළු උපදෙස් ගොවිකම් නිලධාරීන්ගෙන් ලැබුණු අතර, පොළොන්නරුව දි. කෘ. ව්‍යා. නි., බෙනට් ප්‍රනාන්දු මහතාගෙන් ඔහුට ලැබුණේ බලවත් දිරි ගැන්වීමකි.

ඊළඟ වගාව මැයි මස ඇරඹීමටත් තුන්වන වගාව මහ කන්නයේදී කිරීමටත් ජයකොඩි මහතා බලාපොරොත්තු වෙයි. මෙම ක්‍රමය සාර්ථක වේයැයි තමා තුළ බලවත් විශ්වාසයක් ඇතැයි ඔහු පවසයි.

මෙම ක්‍රමය පිළිබඳ අත්හදා බැලීම් දිස්ත්‍රික්කයේ අනිකුත් පෙදෙස්වල ද ඇරඹීමට කටයුතු දැනටමත් යොදා ඇති බැව් කෘෂිකර්ම උපදේශක (වී) පී. කාරියවසම් මහතා ප්‍රකාශ කළේය.